දෙපාර්තමේන්තු චක්‍රලේඛ 09/2024 (i)

මගේ අංකය: DAPH/AD/16/02/06
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණිය
2025.01. 01

ප්‍රධාන ලේකම් මගින්,
පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් මගින්,
සියලුම පළාත් අධ්‍යක්ෂවරුන් වෙත

<u>රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් සතුන්ට ප්‍රතිකාර කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් 2024.09.20 දින නිකුත් කරන ලද දෙපාර්තමේන්තු චක්‍රලේඛ 09/2024 හි අංක 1 කරුණ යටතේ සඳහන් පළාත් පශු වෛද්‍ය කාර්යාලවල පශු වෛද්‍ය නිලධාරීන්ගේ රාජකාරි වේලාව හා අංක 2.2 කරුණ යටතේ සඳහන් කෘෂිකාර්මික නොවන සතුන් සඳහා ප්‍රතිකාර කිරීමේ රාජකාරී වේලාව සංශෝධනය කිරීමට කටයුතු කරන බව මෙයින් දන්වමි.

02. රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යාල වේලාව සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2006.05.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2006 ට අනුව රජයේ සේවාවන්හි නියුතු කණිෂ්ඨ සේවකයින් හැර අනෙකුත් සියළුම සේවකයින්ගේ කාර්යාල වේලාව (දිවා භෝජනය සඳහා විනාඩි 30ක කාලය සමඟ) පෙ.ව 8.30 සිට ප.ව 4.15 දක්වා වේ.

03. ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 1:10:2 වගන්තියට අනුව සෙනසුරාදා දින සේවය කරනු ලබන නිලධාරීන් සඳහා, සතියකට දින පහමාරක් (5 $^{1}/_{2}$) සේවය කලයුතු යැයි නියම කර ඇති රජයේ නිලධරයන් ලෙස සඳහන්ව ඇත.

04. ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්,

i. පළාත් පශු වෛද්‍ය කාර්යාලවල පශු වෛද්‍ය නිලධාරීන්ගේ රාජකාරි වේලාව පහත පරිදි සංශෝධනය කරන බව කාරුණිකව දන්වමි.

සතියේ දිනවල පෙ.ව 8.30 – ප.ව 3.30
සෙනසුරාදා දින පෙ.ව 8.30 - ප.ව 12.15

ii. රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් සුරතල් සතුන්ට ප්‍රතිකාර කරන වේලාව පහත පරිදි සංශෝධනය කරන බව කාරුණිකව දන්වමි.

සතියේ දිනවල පෙ.ව 10.30 දක්වා
සතිඅන්ත එක් දිනක් ප.ව 12.15 දක්වා

05. උක්ත සඳහන් රාජකාරී වේලාව සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් මින් ඉදිරියට කටයුතු නොකරන බවද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

06. මෙම චක්‍රලේඛය 2025.01.01. දින සිට බලපැවැත්වෙන පරිදි නිකුත් කෙරේ.

Hemal Abey

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල

අධ්‍යක්ෂ ජනරාල්

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ.පෙ. 13. ගැටඹේ
පේරාදෙණිය

පිටපත්:-

1. ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
2. සියලුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස
3. සියලුම අධ්‍යක්ෂවරුන්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස
4. ප්‍රධාන ගණකාධිකාරී/ ප්‍රධාන අභ්‍යන්තර විගණක/ ඉංජිනේරු - කා.දැ.ගැ.ස
5. ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී - අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය - කා.දැ.ගැ.ස
6. විගණකාධිපති - කා.දැ.ගැ.ස